www.agaram.lk

NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## තුන්වන වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 7 ශ්‍රේණිය | සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය | කාලය : පැය 1 |
|---|---|---|

## 14 – නව යොවුන් වියට මුහුණ දෙමු.

## I කොටස

- 1 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) නව යොවුන් විය ලෙස හඳුන්වන වයස් කාණ්ඩය වන්නේ,
1) අවු 10 - 15 2) අවු. 10 - 19 3) අවු. 10 - 20 4) අවු. 10 - 17

02) වර්ගයා බෝ කිරීම සඳහා න උපකාරි වන පද්ධතිය වන්නේ,
1) ස්නායු පද්ධතිය 2) පේෂී පද්ධතිය
3) ප්‍රජනක පද්ධතිය 4) අන්තරාසර්ග පද්ධතිය

03) දරුවෙකු පිළිසිඳ ගැනීම සඳහා අවශ්‍ය වන මාතෘ සෛලය වන්නේ,
1) ගර්භාෂය 2) ඩිම්බය 3) ශුක්‍රාණුව 4) ඩිම්බ කෝෂය

04) දරුවෙකු පිළිසිඳ ගැනීමට අවශ්‍ය වන පීතෘ සෛලය වන්නේ,
1) ගර්භාෂය 2) ඩිම්බය 3) ශුක්‍රාණුව 4) ඩිම්බ කෝෂය

05) ඩිම්බයක් හා ශුක්‍රාණුවක් එකතු වීම සිදුවන්නේ,
1) ඩිම්බ කෝෂය තුළදී 2) ගර්භාෂය තුළදී
3) ගැබ්ගෙල තුළදී 4) ඩිම්බ ප්‍රණාලය තුළදී

06) දරුවෙකු බිහිවන තුරු මව්කුස සිටින කාලය මාස,
1) 9 කි 2) 10 කි 3) 12 කි 4ථ) 15 කි

07) දරුවෙකු බිහිවන තුරු මව් කුස තුළ වැඩෙන්නේ,
1) ඩිම්බ කෝෂය තුළ 2) ඩිම්බය තුළ
3) පැලෝපීය නාලය තුළ 4) ගර්භාෂය තුළ

08) ඔසප් ක්‍රියාවලිය සිදුවන්නේ දින,
1) 20 කට වරක් 2) 14 කට වරක්
3) 30 කට වරක් 4) 28 ක වරෙකි

09) ගැහැණු දරුවෙකුගේ ද්විතියික ලිංගික ලක්ෂණ ඇතිවීම කෙරෙහි බලපාන හෝර්මෝනය වනුයේ,
1) ඊස්ට්‍රජන් 2) ප්‍රොජෙස්ටරෝන්
3) ටෙස්ටොස්ටෙරෝන් 4) ඊස්ට්‍රජන් හා ප්‍රොජෙස්ටරෝන්

10) ගැහැණු දරුවෙකු පළමු වරට ඔසප් වීම හඳුන්වන්නේ,
1) ආර්තවය ලෙස 2) ඩිම්බ මෝචනය ලෙස
3) මල්වර වීම ලෙස 4) ආර්තව හරණය ලෙස

(2 x 10 = 20)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

## II කොටස

- **ප්‍රශ්න සියල්ලම පිළිතුරු සපයන්න.**

01) නව යොවුන් විය හඳුන්වන වෙනත් නම් 3ක් ලියන්න. (ල. 3)

02) ප්‍රජනක සෞඛ්‍යය ලෙස හඳුන්වන්නේ කුමක්ද? (ල. 5)

03) ස්ත්‍රී ප්‍රජනක පද්ධතියේ කොටස් 4 ක් නම් කරන්න. (ල. 4)

04) පුරුෂ ප්‍රජනක පද්ධතියේ කොටස් 4 ක් නම් කරන්න. (ල. 4)

05) නව යොවුන් වියේ ගැහැණු දරුවෙකු තුළ දැකිය හැකි කායික ද්විතියික ලිංගික ලක්ෂණ 8 ක් ලියන්න. (ල. 8)

06) නව යොවුන් වියේ පිරිමි දරුවෙකු තුළ දැකිය හැකි කායික ද්විතියික ලිංගික ලක්ෂණ 8 ක් ලියන්න. (ල. 8)

07) නව යොවුන් වියේ දරුවන්ගේ දැකිය හැකි මානසික ලක්‍ෂණ 6ක් ලියන්න (ල. 06)

08) නව යොවුන් වියේ දරුවන්ගේ දැකිය හැකි සාමාජීය ලක්‍ෂණ 6ක් ලියන්න (ල. 06)

09) යොවුන් වියට සූදානම් වීමේදී අප තුළ වර්ධනය කරගත යුතු (කායික සූදානම සඳහා) වැදගත් කරුණු 5 ක් ලියන්න. (ල. 10)

10) යොවුන් වියට සූදානම් වීමේදී මානසික සූදානම සඳහා අප තුළ වර්ධනය කරගත යුතු නිපුණතා 6 ක් ලියන්න. (ල. 6)

11) සමාජීය සූදානම සඳහා අප තුළ වර්ධනය කළ යුතු නිපුණතා 6 ක් ලියන්න. (ල. 12)

12) ප්‍රජනක පද්ධතිය පිළිබඳව ඇති මිත්‍යා මත 3 ක් ලියන්න (ල. 3)

13) සමාජ රෝග 5ක් ලියන්න. (ල. 5)

ලකුණු හා සැකසුම – G.S ප්‍රේමචන්ද්‍ර

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk